72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය නිවේදනය

**නිකුත් කිරීම**

දිනය: 2024 සැප්තැම්බර් 13
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව.04.00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ලේකම් / පරිපාලක
විද්‍යුත් තැපැල: info `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# 2024 අගෝස්තු මස සජිත් ප්‍රේමදාසගේ හිතකරතා ශ්‍රේණිගත කිරීමේ වර්ධනයක්; අනුර කුමාර දිසානායක සහ ජනාධිපති වික්‍රමසිංහට වැටීමක්

## *සියලුම ප්‍රමුඛ ජනාධිපති අපේක්ෂකයින් පිළිබඳ මහජනතාව තුළ සෘණාත්මක මතයක් පැවති නමුත් අනුර කුමාර දිසානායකට අවම සෘණ අගයක්*

2024 අගෝස්තු IHP SLOTS මත විමසුමේ දී, ස.ජ.බ. නායක සජිත් ප්‍රේමදාසගේ සමස්ත හිතකරත්ව ශ්‍රේණිගත කිරීම ජූලි මාසයට සාපේක්ෂව ලකුණු 10කින් ඉහළ ගොස් ලකුණු -32 දක්වා වර්ධනය විය. මේ අතර, ජා.ජ.බ./ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායකගේ සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ හිතකර ශ්‍රේණිගත කිරීම් පිළිවෙලින් ලකුණු 16කින් සහ ලකුණු 4කින් පහත වැටී, පිළිවෙලින් -21 හා -33 දක්වා පිරිහී තිබේ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජනාධිපතිවරණ අපේක්ෂක නාමල් රාජපක්ෂගේ හිතකරතා ශ්‍රේණිගත කිරීම අගෝස්තු මාසයේ දී -89ක් විය.



එක් එක් මාසය සඳහා වන හිතකරත්ව ඇස්තමේන්තු පදනම් වන්නේ, අවම ප්‍රතිචාර එකතුවක් සහතික කිරීම සඳහා එම මාසය තුළ දී සහ ඊට පෙර සහ පසු සති කිහිපයක් තුළ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 100-500ක් මත ය. 2024 අගෝස්තු මස ඇස්තමේන්තු සජිත් ප්‍රේමදාස සඳහා සම්මුඛ සාකච්ඡා 517ක් ද, අනුර කුමාර දිසානායක සඳහා 491ක් ද, රනිල් වික්‍රමසිංහ සඳහා 530ක් ද, නාමල් රාජපක්ෂ සඳහා 639ක් ද, සහ ගෝඨාභය රාජපක්ෂ සඳහා 384ක් ද මත පදනම් වී ඇත.

**සංස්කාරකවරුන්ට සටහන**

1. ඇතැම් විට මහජනතාව ජනමාධ්‍ය වාර්තා කරන මෙම සංඛ්‍යා වරදවා වටහා ගන්නාබව අප නිරීක්ෂණයකර ඇත. සෘණ ලකුණු, එනම්, ශුන්‍යයට වඩා අඩු සමස්ත හිතකරත්ව ශ්‍රේණිගත කිරීමකින් අදහස් වන්නේ එම පුද්ගලයා හෝ ආයතනය කෙරෙහි **හිතකර මතයක් නොපවතිනබව** යි. ධනාත්මක ලකුණුවලින් පමණක්, එනම්, ශුන්‍යයට වඩා වැඩි සමස්ත හිතකරත්වයකින් පමණක්, අදාළ පුද්ගලයා හෝ ආයතනය කෙරෙහි **හිතකර මතයක් පවතිනබව** අදහස් වෙයි.
2. මාධ්‍ය වාර්තාකරණය සඳහා වන මැතිවරණ කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවලට අනුකූලවීම සඳහා, සමීක්ෂණ ක්‍රමවේදය සහ අරමුදල් පිළිබඳ සටහන් විස්තර පහත දක්වා ඇත.

**අදාළ වාර්තා**


Institute for Health Policy, August 2024, “AK Dissanayake’s and President Wickremesinghe’s favourability ratings largely improved in July 2024” Available at: https://ihp.lk/press-releases/ak-dissanayakes-and-president-wickremesinghes-favourability-ratings-largely-improved

Institute for Health Policy, July 2024, “Favourability of Sajith Premadasa and Pres. Ranil Wickremasinghe improves in June 2024, But AK Dissanayake continues to lead” Available at: https://ihp.lk/press-releases/favourability-sajith-premadasa-and-pres-ranil-wickremasinghe-improves-june-2024-ak

Institute for Health Policy, April 2024, “Favourability of Sajith Premadasa improves in March 2024, But AK Dissanayake continues to lead” Available at: https://ihp.lk/press-releases/favourability-sajith-premadasa-improves-march-2024-ak-dissanayake-continues-lead

Institute for Health Policy, March 2024, “Favourability ratings of major party leaders declined in February 2024” Available at: https://ihp.lk/press-releases/favourability-ratings-major-party-leaders-declined-february-2024

Institute for Health Policy, February 2024, “AK Dissanayake sees favourability ratings improve, but other party leaders see declines in January 2024.” Available at: https://ihp.lk/press-releases/ak-dissanayake-sees-favourability-ratings-improve-other-party-leaders-see-declines

Institute for Health Policy, December 2023, “Sajith Premadasa’s favourability rating improved in November, but still trailed AK Dissanayake.” Available at: *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231215.pdf*

Institute for Health Policy, November 2023, “AK Dissanayake continues to see his favourability improve, while it worsens for other party leaders.” Available at: *https://ihp.lk/news/pres_doc/IHPPressRelease20231117.pdf*

Institute for Health Policy, April 2022, “SLOTS Favourability Ratings: Methodology for tracking public favourability”, SLOTS Report #2022-03. *Available at: https://ihp.lk/publications/docs/SLOTSReport202203.pdf*

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

මෙම සමීක්ෂණය සැලසුම් කිරීම සහ පැවරීම සඳහා IHP මුළුමනින්ම වගකිව යුතු අතර, එහි පූර්ණ වගකීම දරයි. IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTSහි ප්‍රධාන විමර්ශක වන IHPහි ආචාර්ය රවී රන්නන්-එළිය, හාවඩ් විශ්වවිද්‍යාලයයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර, දශක තුනක් පුරා ලංකාව තුළ හා ලංකාවෙන් පිටත විවිධ මත විමසුම් සමීක්ෂණ සිදුකර තිබේ.

**ක්‍රමවේදය**

SLOTS විසින් අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) ජාතික නියැදියක්, සහ අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවලින් පුද්ගලයින් බඳවා ගැනීමට ස්තරීකරණය වූ සම්භාවිතා නියැදි යොදාගත් ක්ෂේත්‍ර සමීක්ෂණයක් හරහා බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියක් සමීක්ෂණය කරයි. SLOTS මඟින් ප්‍රසිද්ධ චරිතයක් හෝ ආයතනයක් පිළිබඳව හිතකර හෝ අහිතකර මතයක් තිබේදැ යි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසීම තුළින් හිතකරත්වය නිරීක්ෂණය කරනු ලබයි. සමස්ත හිතකරත්වය යනු ධනාත්මක (+100) සහ සෘණාත්මක (-100) ප්‍රතිචාරවල සාමාන්‍යය වේ. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අංශය, පළාත සහ පසුගිය 2019 සහ 2020 මැතිවරණවලදී ඡන්දය ලබා දුන් ආකාරය භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම ඇස්තමේන්තු භරණයකර නැවත සකසා ඇත. මාසික ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ සෑම මාසයකම සහ ඊට පෙර සහ පසු සතිවල කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ 100+ ක නියැදියක් මත ය. මෙම යාවත්කාලීනය සඳහා පෙර යාවත්කාලීනයට වඩා මෑත දත්ත කට්ටලයක් භාවිතා කරන බැවින්, පෙර මාස සඳහා හිතකරතව ශ්‍රේණිගත කිරීම් ඇස්තමේන්තුවලට වඩා කුඩා වෙනස්කම් ඇත.

**අරමුදල් සැපයීම**

දෙදහස් විසි එක වර්ෂයේ සිට SLOTS ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රාහකයින් පරාසයක් සහාය දක්වා ඇති අතර, ඔවුන් අධ්‍යයනය සැලසුම් කිරීම, දත්ත විශ්ලේෂණය කිරීම හෝ වාර්තා කිරීමේ දී කිසිදු කාර්යයභාරයක් ඉටු නොකරයි. නීලන් තිරුචෙල්වම් භාරය, ආසියා පදනම, යුරෝපා කොමිසම, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ඕපන් සොසයටි ෆවුන්ඩේෂන් ආයතනය සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා මීට පෙර අරමුදල් සපයා ඇත. වර්තමාන පර්යේෂණ කටයුතු සඳහා මූල්‍ය දායකත්වය සැපයෙන්නේ වීලුකස් ස්ටිෆ්ටුන්ග් පදනම, අබුඩාබියේ නිව්යෝක් විශ්වවිද්‍යාලයය, සහ IHP මහජන සුබසාධන පර්යේෂණ අරමුදල විසිනි. තව ද, සමීක්ෂණ සොයාගැනීම් අවශ්‍යයෙන්ම අතීත සහ වර්තමාන අරමුදල් සපයන්නන්ගේ අදහස් හෝ ස්ථාවරයන් පිළිබිඹු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධකර ගත හැකි ය.